දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

මගේ අංකය / எமது இல. / My No. ED/04/60/01/15/IV

දිනය / திகதி / Date 2014.10. 29

චක්‍රලේඛ අංක- 33/2014

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999.07.02 දිනැති 1086/26 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරමින් 2014 ඔක්තෝබර් 22 දින අංක 1885/31 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2008.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යවස්ථාව රජයේ මුද්‍රණාලයේ www.documents.gov.lk හා අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවිවල පළ කර ඇත.

පහත උපදෙස් අනුගමනය කරමින් මෙම නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අවධාරණය කරමි.

1. **මෙම ව්‍යවස්ථාවට අනුව 3, 2 හා 1 යන පන්ති සහ III, II හා I ශ්‍රේණි යන්නෙන් එකම තේරුමක් අදහස් වේ.**

2. **අන්තර්ග්‍රහණය කිරීම**

2008.07.01 දිනට සේවයේ සිටි විදුහල්පති සේවයේ නිලධාරීන් මෙම ව්‍යවස්ථාවේ 17 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ඒ අනුව,

2.1) ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියේ සියලුම නිලධාරින් නව ව්‍යවස්ථාවේ 3 පන්තියට

2.2) ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පංතියේ II ශ්‍රේණියේ සියලුම නිලධාරින් සේවයේ 2 පන්තියට

2.3) ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියේ සිටින පෙර සේවා ව්‍යවස්ථාවට අනුව 2008.07.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියට උසස්වීමට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සේවයේ 1 පන්තියට

2.4) ඉහත 2.3 යටතේ අන්තර්ග්‍රහණය නොවූ 2 පන්තියේ I ශ්‍රේණියේ සියලුම නිලධාරීන් සේවයේ 2 පන්තියට

2.5) ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ සියලුම නිලධාරීන් සේවයේ 1 පන්තියට

2.6) අන්තර්ග්‍රහණයේදී විදුහල්පති සේවයේ නිලධාරීන් සිටින ශ්‍රේණිය ලෙස සැළකිය යුත්තේ 2008.06.30 දිනට සිටි ශ්‍රේණියයි. 2008.06.30 හෝ එදිනට පෙර විශ්‍රාම ගිය නිලධාරීන්ට මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අදාල නොවේ.

3. **2008.07.01 දින සිට 2014.10.22 දින දක්වා ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවාගත් නිලධාරීන් සඳහා වන විධිවිධාන.**

2008.07.01 සිට නව සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2014.10.22 දින දක්වා ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවාගත් නිලධාරීන්ට සේවයට බඳවාගත් දින සිට නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල වේ.

ඒ අනුව එම කාල සීමාව තුලදී,

3.1) 3 පන්තියට බඳවාගත් නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 3 පන්තියටද

3.2) 2-II ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 2 පන්තියටද ඇතුලත් වේ.

4. **වැටුප් ක්‍රමය**

4.1) 2008.07.01 දින සිට ක්‍රියාත්මක වැටුප් කේත අංකය G-E-4-2006 වේ. (2010.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (viii) අනුව)
ඊට අදාල වැටුප් පරිමාණය -

රු. 17060 – 7 x 330 – 6 x 400 – 11 x 645 – 14 x 790 - රු.39925

4.2) ඒ අනුව විදුහල්පති ශ්‍රේණියේ නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කළ පසු, දැනට ලබන වැටුප් පරිමාණය වන TS-3-2006 A (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) අනුව) වැටුප් පරිමාණයේ 2008.06.30 දිනට ලබමින් සිටි වැටුප පදනම් කර ගනිමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (viii) හි උප ලේඛන II ට අනුව 2008.07.01 දින සිට G-E-4-2006 වැටුප් පරිමාණයට වැටුප පරිවර්තනය කළ යුතුය.

2010.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2010 හි 2.3 වගන්තිය අනුව මෙම වැටුප් ගෙවීම ක්‍රියාත්මක කළ යුත්තේ 2011.01.01 දින සිටය.

4.3) මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 3/2014 හි විධිවිධාන පරිදි තවදුරටත් අවශ්‍ය නිලධාරීන් සඳහා ගැලපුම් දීමනාව ගෙවිය යුතුය.

4.4) 2008.07.01 දින සිට මේ දක්වා විශ්‍රාම ලබා ඇති විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වැටුපද මේ අනුව සංශෝධනය කර 2011.01.01 දින සිට ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ගෙවීම සිදු කළ යුතුය.

මෙහිදී 2008.07.01 දින සිට 2011.01.01 දින දක්වා විශ්‍රාම ලබා ඇති විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වැටුප සංශෝධනය කර ඒ අනුව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කර 2011.01.01 දින සිට හිඟ වැටුප් ගෙවිය යුතුය.

**5. අන්තර්කාලය තුලදී උසස් කිරීම**

2016.01.01 දින දක්වා අන්තර්කාලය බල පැවැත්වේ.

5.1) එම කාලය තුල II හා I ශ්‍රේණිවලට උසස් කිරීමේදී ව්‍යවස්ථා සංග්‍රහයේ 18 වගන්තියේ විධිවිධානවලට යටත්ව 10.1 හා 10.2 වගන්ති අනුව උසස්වීම් සිදු කරනු ලැබේ. උසස්වීම් අදාල වනුයේ උසස්වීම සඳහා සියළු සුදුසුකම් සම්පූර්ණ කරන දිනට සේවයේ යෙදී සිටින විදුහල්පති ශ්‍රේණියේ නිලධාරීන්ට පමණි.

5.2) උසස්වීම් සඳහා ව්‍යවස්ථාවේ 'ඉ' හා 'ඊ' ආකෘති පත්‍ර අනුව අදාල නිර්දේශයද සමග මා වෙත ඉදිරිපත් කළ යුතුය.

**6. කාර්යක්ෂමතා කඩඉම**

6.1) අංක 1086/26 හා 1999.07.02 දිනැති සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014 හා 2015 වසරවලදී පමණක් පැවැත්වේ.

6.2) නව සේවා ව්‍යවස්ථාව අනුව කාර්යක්ෂමතා කඩඉම 2015 වසරේ සිට පැවැත්වේ.

6.3) අංක 1086/26 හා 1999.07.02 දිනැති සේවා ව්‍යවස්ථාව යටතේ පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත් නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**7. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව පැවැත්වීම**

මෙම පුහුණු පාඨමාලා පැවැත්වීම පිළිබඳ ඉදිරියේදී අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය මගින් චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ලැබේ.

**8. අන්තර්කාලයෙන් පසුව මෙම නව සේවා ව්‍යවස්ථාව ඒ අකාරයෙන්ම ක්‍රියාත්මක වේ.**

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය